සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

15 S I, II

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය, 2023(2024)
கல்விப் பொதுத் தராதரப் பத்திர (சாதாரண தர)ப் பரீட்சை, 2023(2024)
General Certificate of Education (Ord. Level) Examination, 2023(2024)

| | |
|---|---|
| ක්‍රිස්තියානි ධර්මය | I, II |
| கிறிஸ்தவம் | I, II |
| Christianity | I, II |

පැය තුනයි
மூன்று மணித்தியாலம்
Three hours

| | | |
|---|---|---|
| අමතර කියවීම් කාලය | - | මිනිත්තු 10 යි |
| மேலதிக வாசிப்பு நேரம் | - | 10 நிமிடங்கள் |
| Additional Reading Time | - | 10 minutes |

අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත් පිළිතුරු ලිවීමේදී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදාගන්න.

## ක්‍රිස්තියානි ධර්මය I

**උපදෙස්:**

* **සියලු ම** ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
* අංක **1** සිට **40** තෙක් ප්‍රශ්නවල, දී ඇති (1), (2), (3), (4) යන පිළිතුරුවලින් **නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ** පිළිතුර තෝරා ගන්න.
* **ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරෙන් ඔබ තෝරාගත් පිළිතුරෙහි අංකයට සැසඳෙන කවය තුළ (X) ලකුණ යොදන්න.**
* එම පිළිතුරු පත්‍රයේ පිටුපස දී ඇති අනෙක් උපදෙස් ද සැලකිල්ලෙන් කියවා, ඒවා ද පිළිපදින්න.

**1.** "බලන්න මම ස්වාමින් වහන්සේගේ දාසිය වෙමි; ඔබ පැවසූ ලෙස මට ඉටුවේවා." යි පැවසුවේ,
(1) එළිසබෙත්තුමියයි. (2) අන්නා දිවැසිවරියයි.
(3) මාර්තාතුමියයි. (4) මරියතුමියයි.

**2.** ජේසුස් වහන්සේගේ ශ්‍රේෂ්ඨත්වය ප්‍රකාශ කළ දිවැසිවරයා වනුයේ,
(1) මීකා දිවැසිවරයා ය. (2) යෙසායා දිවැසිවරයා ය.
(3) මලාකි දිවැසිවරයා ය. (4) ජෙරමියා දිවැසිවරයා ය.

**3.** මරණයට පෙර මෙසියස් වහන්සේ දකින බවට අනාවරණය වූයේ කා හටද?
(1) ස්නාවක ජොහාන්ට (2) දේව මාලිගයේ විසූ සිමියොන්ට
(3) සෙකරියස් පූජකතුමාට (4) පාවුල්තුමාට

**4.** ජේසුස් වහන්සේ කුරුසිය මත ඇණ ගැසීමට ගෙන ගිය ස්ථානය වන්නේ,
(1) කපාලපිටිය ය. (2) සමාරි ය.
(3) ගලීලය ය. (4) ජොප්පාව ය.

**5.** ප්‍රථම ගෝලයන් අතුරෙන්, පාපී ස්වභාවය තේරුම් ගෙන කීකරු වී ගෝලකමට ප්‍රතිචාර දැක්වූයේ,
(1) ජාකොබ් ය. (2) අන්ද්‍රෑ ය.
(3) ජොහාන් ය. (4) සීමොන් පේදුරු ය.

**6.** සදහටම පවතින ශ්‍රේෂ්ඨතම ධර්මතාවය වන්නේ,
(1) ප්‍රේමයයි. (2) ඉවසීමයි. (3) කරුණාවයි. (4) නිහතමානිකමයි.

**7.** ස්නාවක ජොහාන්ගේ ඉගැන්වීම් අනුව දේව බලාපොරොත්තුවෙන් ජීවත් වීමට අප කළ යුත්තේ කුමක් ද?
(1) ව්‍යවස්ථාව නිසි ලෙස අනුගමනය කිරීම
(2) පසුතැවිලි වී ජීවිත වෙනස් කිරීම
(3) දේශපාලන බලධරයනට විරුද්ධව නැගී සිටීම
(4) ආගමික නායකයන් සමග එක්වීම

[දෙවැනි පිටුව බලන්න.

**8.** ජේසුස් වහන්සේගේ උපතට බොහෝ කලකට පෙර
(1) ඒ පිළිබඳ දිවැස් වැකි පළ විය.
(2) ඒ පිළිබඳ දිවැස් වැකි නිහඬ විය.
(3) ඒ පිළිබඳ දිවැස් වැකි රහසිගත විය.
(4) ඒ පිළිබඳ ආගමික නායකයන්ට පමණක් ඇසීම සිදුවිය.

**9.** ස්වාමීන් වහන්සේගේ යාච්ඤාව තුළ සමාව ඉල්ලීමේ දී අප කළ යුත්තේ කුමක් ද?
(1) ඉල්ලන පුද්ගලයන්ට සමාව දීම (2) අපට වරද කරන අයට සමාව දීම
(3) සත්වරක් සමාව දීම (4) කොන්දේසි සහිතව සමාව දීම

**10.** දිළිඳු වැන්දඹුවගේ පඬුරු පූජාවෙන් කිතුනුවාට ලැබෙන පණිවිඩය වන්නේ,
(1) දෙවියන්ගේ නීතියට අනුව පූජාකර සෑහීමකට පත්වීමයි.
(2) පරිත්‍යාගශීලීව පූජාකර සෑහීමකට පත්වීමයි.
(3) ඉල්ලන විට පමණක් පූජාකර සෑහීමකට පත්වීමයි.
(4) රිසිසේ තමා සතුව තබාගෙන ඉතිරිය පූජා කර සෑහීමකට පත්වීමයි.

**11.** ජුදෙව් කෘෂිකාර්මික මංගල්‍යයක් ලෙස සලකන්නේ,
(1) පාස්කු මංගල්‍යයයි. (2) පෙන්තකොස්ත මංගල්‍යයයි.
(3) කූඩාරම් මංගල්‍යයයි. (4) පුයිරිම් මංගල්‍යයයි.

**12.** දෙවියන් වහන්සේ අපේ ජීවිතවලට උරුම කරදෙන උසස් ම තිළිණය වන්නේ,
(1) ක්‍රිස්තියානි නම දැරීමට හැකිවීම ය.
(2) ලෞකික දිවියේ එල භුක්ති විඳීමට හැකිවීම ය.
(3) සභා සාමාජිකත්වය ලබා ගැනීමට හැකිවීම ය.
(4) සදාකාල ජීවනයට උරුමය ලැබීමට හැකිවීම ය.

**13.** තම කම නසා දැමීමට යොමු වන කිතුනුවන්ගේ යාච්ඤාව විය යුත්තේ,
(1) සෑම ඉල්ලීමක්ම ලැබේවා යන්නයි.
(2) සෞභාග්‍ය දිවියක් උරුම වේවා යන්නයි.
(3) ඔබ වහන්සේගේ කැමැත්ත ඉටුවේවා යන්නයි.
(4) සුඛෝපභෝගී ආහාර ලැබේවා යන්නයි.

**14.** ජේසු කුමාගේ උපත අර්ථවත් ලෙස සැමරීමට කිතුනු අප කළ යුත්තේ,
(1) අවශ්‍යතා ඇති අය සොයා ඔවුන් සමග නත්තල් ප්‍රීතිය බෙදා ගැනීම ය.
(2) නත්තල් සීයා හා නත්තල් ගහ පිළිබඳ වැඩි අවධානයක් යොමු කිරීම ය.
(3) නත්තල් දින ප්‍රිය සම්භාෂණ සඳහා සූදානම් වීම ය.
(4) දේවස්ථාන සැරසිලි හා ආලෝක බුබුළුවලින් වර්ණවත් කිරීම ය.

**15.** ලොව පුරා සාගතයක් ඇතිවන බවට අනාවැකි ප්‍රකාශ කළ දිවැසිවරයා වන්නේ,
(1) ක්ලෞදියස් ය. (2) අගබස් ය. (3) ජොහන් මාර්ක් ය. (4) පාවුල් තුමා ය.

**16.** පහත සඳහන් ප්‍රකාශ සලකා බලන්න.

A - මව්කුසට පිවිස ඉපදිය යුතු බව
B - පාපයට මැරී ජීවනයට උපදින බව
C - නැවත ස්වර්ගයේ උපදින බව
D - ආකල්පමය වෙනසක් ඇතිවිය යුතු බව

නැවත උපදින්නට ඕනෑ යැයි ජේසුස් වහන්සේ නිකදේමුස්ට ප්‍රකාශ කරමින් අදහස් කරන ලද්දට වඩාත් ම ගැළපෙන ප්‍රකාශ යුගලය අඩංගු පිළිතුර කුමක් ද?
(1) A හා B (2) B හා C (3) B හා D (4) C හා D

[තුන්වැනි පිටුව බලන්න.

2598

**17.** පවුල් සංස්ථාව තුළින් සමාජීය සංවර්ධනය වීමට අප විසින් කළ යුත්තේ කුමක් ද?
(1) පවුල තුළ තම කමට මුල්තැන දීම ය.
(2) පවුලේ තත්ත්වය ඉහළ දැමීමට මුල්තැන දීම ය.
(3) පවුලේ අභිමතාර්ථයන් ඉටු කිරීමට මුල්තැන දීම ය.
(4) පවුල තුළ ප්‍රේමය, සාමය හා රැකබලාගැනීමට මුල්තැන දීම ය.

**18.** පාසල් දරුවකු වශයෙන් ශුද්ධකමේ ජීවිතයක් ගත කිරීමට අවශ්‍ය කරුණු යුගලය වන්නේ,
(1) මත්ද්‍රව්‍ය භාවිතය වැනි මාර්ගවලින් මිදීම හා දේවගරුබියෙන් ජීවත් වීමයි.
(2) ගුරුවරුන්ට කීකරු වීම හා සමාජ රැල්ලට අනුව ජීවත් වීමයි.
(3) දෙමාපියන්ට ගෞරව කිරීම හා දුර්වල ශිෂ්‍යයන්ට පීඩා කිරීමයි.
(4) තම මිතුරු කල්ලියේ අදහස් අනුමත කිරීම හා තෘෂ්ණාවලට වහල් වීමයි.

**19.** ස්නාවක ජොහාන්ගේ උපත හා මෙහෙවර අනුව අප ජීවිත හැඩගස්වා ගත යුතු වන්නේ,
(1) ජනතා සැලැස්ම අනුව ය.
(2) නායකයන්ගේ සැලැස්ම අනුව ය.
(3) දේව සැලැස්ම අනුව ය.
(4) ආයතනවල සැලැස්ම අනුව ය.

**20.** කිතුනුවන් සහජීවනයෙන් දිවි ගෙවිය යුත්තේ,
(1) මිශ්‍ර විවාහ තුළ බිහිවන පවුල් ඒකක ප්‍රතික්ෂේප කිරීමෙනි.
(2) සියලු විශ්වාස සමාන බව පිළිගැනීමෙනි.
(3) සමාජ යහපත පතා ක්‍රියා කරන ආයතනවලට සම්බන්ධවීමෙනි.
(4) අපේ විශ්වාසය මගින් අන් අයට බලපෑම් කිරීමෙනි.

**21.** දේව බලය කෙරෙහි තිබූ මවිතකර ඇදහිල්ල පිළිබඳ ජේසුස් වහන්සේ විසින් ඉතා අගය කළ විජාතිකයා වන්නේ,
(1) කපර්ණවුමෙහි අන්ධ මිනිසා ය.
(2) කපර්ණවුමෙහි ශතාධිපතියා ය.
(3) ජෙරිකෝවේ ධනවත් මිනිසා ය.
(4) ජයිරස්ගේ දියණිය ය.

**22.** කුඩාරම් කර්මාන්තයේ යෙදෙමින් ධර්මදූත සේවයට ශක්තියක් දුන් අකිලා සහ ප්‍රිස්කිලාගෙන් අප උගත යුතු පාඩම වන්නේ,
(1) දේව සේවයේ යෙදීමට ලෞකික රැකියාවක් අවශ්‍ය බව ය.
(2) දේව සේවයේ යෙදෙමින් ඔබට ඔබේ ලෞකික අවශ්‍යතා සපුරාගත හැකි බව ය.
(3) එකම කර්මාන්තයේ යෙදෙන්නන් එකට එකතුවිය යුතු බව ය.
(4) දේව සේවයේ යෙදෙන අතරම ඔබට ඇති හැකියාවන්ගෙන් උපරිම ප්‍රයෝජන ගත යුතු බව ය.

**23.** ජොහාන් සුබසුනෙහි 'සේමෙයොන්' යන ග්‍රීක වදනේ අර්ථය වන්නේ,
(1) ආලේපලත් තැනැත්තා යන්නයි.
(2) විශේෂ ලෙස පුහුණු කර යවනු ලැබූ තැනැත්තා යන්නයි.
(3) සම්පූර්ණ සාමය යන්නයි.
(4) දේවබල ලකුණු යන්නයි.

**24.** 'අගපේ' නමැති ග්‍රීක වචනයෙන් අර්ථවත් වන්නේ,
(1) අන් අයහට යහපත උදා කරන ප්‍රේමයයි.
(2) අන් අය වෙනුවෙන් කැපවුණු ඉවසීමයි.
(3) අන් අය වෙනුවෙන් කරන සේවයයි.
(4) අන් අයගේ යහපත වෙනුවෙන් පෙන්වන නිහතමානීකමයි.

**25.** "කිසිවෙකුගෙන් බලහත්කාරයෙන් කිසිවක් පැහැර නොගන්න." යනුවෙන් ප්‍රකාශ කළේ කවුරුන් විසින් කා හට ද?
(1) ජේසුස් වහන්සේ විසින් හේවායන්ට ය.
(2) පරිසිවරු විසින් හේවායන්ට ය.
(3) ස්නාවක ජොහන්තුමා විසින් හේවායන්ට ය.
(4) සද්දුසිවරු විසින් හේවායන්ට ය.

**26.** ධර්මිෂ්ඨකම නොතකා ක්‍රියා කරන ජුදෙව් ජනතාව අවදි කිරීමට ජේසුස් වහන්සේ සිදුකළ ක්‍රියාවක් වන්නේ,
(1) දේව මාලිගයේ දේශනයක් පැවැත්වීමයි. (2) ජෙරුසලම ආරක්ෂා කිරීමට පියවර ගැනීමයි.
(3) දේව මාලිගය පවිත්‍ර කිරීමයි. (4) ජෙරුසලම අවට පමණක් සේවය කිරීමයි.

**27.** නාසරෙත්හි ජේසුස් වහන්සේගේ දේශනය අද දිනට අදාළ කරගන්නේ කෙසේ ද?
(1) කිතුනුවන්ට පමණක් සීමා වූ යහපත් සමාජයක් ස්ථාපනය කිරීම මගින්
(2) තෝරාගත් කණ්ඩායමක් සඳහා පමණක් යහපත් සමාජයක් ගොඩනැගීම මගින්
(3) අපගේම පවුල්වලට සීමා වූ යහපත් සමාජයක් ගොඩනැගීම මගින්
(4) සමස්ත ජනතාව උදෙසා යහපත් සමාජයක් ගොඩනැගීමට දායකවීම මගින්

**28.** කිතුනුවන් ලෙස අප ජීවිත හැඩගසාගත යුත්තේ,
(1) නිරතුරුව දේවස්ථාන පූජාවන්ට සහභාගි වීමෙන් ය.
(2) උසස් යැයි පිළිගනු ලැබූවන් ඇසුරු කර අභියෝග ජය ගැනීමෙන් ය.
(3) ප්‍රේමය, ඉවසීම සහ යුක්තිය මත පදනම් වූ ජීවිතයක් ගත කිරීමෙන් ය.
(4) සියලු දෙනාගේ කල්ක්‍රියා පිළිගනිමින් ජීවත්වීමෙන් ය.

**29.** පහත සඳහන් ප්‍රකාශ සලකා බලන්න.

A - ජේසුස් වහන්සේ හඳුනාගැනීමට ඉවසීමෙන් ද බලාපොරොත්තුවෙන් ද සිටීම
B - ජේසුස් වහන්සේ හඳුනාගැනීම මහලුවියේදී වැදගත් බව
C - ජේසුස් වහන්සේ වටහාගැනීමට ශුද්ධාත්ම මඟපෙන්වීම ලැබිය යුතු බව
D - ජේසුස් වහන්සේ අත්දැකීමට ආගමික කණ්ඩායම් අතර ගැවසිය යුතු බව

සිමියොන් සහ අන්නාගේ ජීවිත මගින් අප ඉගෙන ගත යුතු කරුණු ඇතුළත් ප්‍රකාශ යුගලය අඩංගු පිළිතුර කුමක් ද?
(1) A හා B (2) A හා C (3) B හා C (4) B හා D

**30.** ස්නාවක ජොහාන්ගේ ඉගැන්වීම් අද ඔබ පාසල තුළ ක්‍රියාත්මක කළ හැකි වන්නේ,
(1) බඩු බාහිර ආදිය මිතුරන් අතර පමණක් හුවමාරු කරගැනීම දිරිගැන්වීමෙන් ය.
(2) ආහාර නැති සිසුන් සමග තම ආහාර බෙදා ගැනීමට දිරිගැන්වීමෙන් ය.
(3) අන් ශිෂ්‍යයන්ගෙන් ආහාර ගැනීමට ශිෂ්‍ය නායකයන් දිරිගැන්වීමෙන් ය.
(4) හැකියාවන් නොබලා ආහාර ගෙන ඒමට සියලු සිසුන්ට බලපෑම් කිරීමෙන් ය.

**31.** දේව රාජ්‍යයේ පුරවැසිභාවය ලැබීමට නිහතමානිත්වය වැදගත් බව පෙන්නුම් කරමින් ජේසුස් වහන්සේ ඉගැන්වූ උපමාව වන්නේ,
(1) පරිසියා හා අයකැමියා පිළිබඳ උපමාවයි.
(2) අත්තිවාරම් දෙක පිළිබඳ උපමාවයි.
(3) නැති වූ පුත්‍රයා පිළිබඳ උපමාවයි.
(4) මිදිවත්ත හා ගොවීන් පිළිබඳ උපමාවයි.

**32.** වපුරන්නාගේ උපමාව මගින් පිළිබිඹුවන සත්‍ය වන්නේ,
(1) දේව වචනයට සවන් දෙන්නන් පමණක් වීම ය.
(2) දේව වචනය අධ්‍යයනය කිරීමෙහි පමණක් යෙදෙන්නන් වීම ය.
(3) දේව වචනය මගින් බාධා පසුකරමින් වර්ධනය වීමට ඉඩ සැලසීම ය.
(4) දේව වචනය පිළිබඳ තර්ක විතර්කවල යෙදීම ය.

**33.** "මරන්න ගෙන යන බැටළුවෙකු මෙන් ද උගේ ලොම් කපන්නා ඉදිරිපිට ගොළුව සිටින බැටළුවෙකු මෙන් ද ..." යන ප්‍රකාශයෙන් හඳුන්වාදෙනු ලබන්නේ,

(1) ජේසුස් වහන්සේගේ සේවකත්වය තුළ අසරණ ස්වභාවයයි.

(2) ජේසුස් වහන්සේගේ සේවකත්වය තුළ දුක් වූ ස්වභාවයයි.

(3) ජේසුස් වහන්සේගේ සේවකත්වය තුළ පරිත්‍යාගශීලී ස්වභාවයයි.

(4) ජේසුස් වහන්සේගේ සේවකත්වය තුළ කැළඹුණු ස්වභාවයයි.

**34.** දේව රාජ්‍යයේ ප්‍රතිපත්ති මත පිහිටා ක්‍රියා කරන ඔබ,

(1) විශේෂ අවශ්‍යතා ඇති අය නොසලකයි.

(2) තම දක්ෂතාව අනුව දුර්වල සිසුන්ට සහාය වෙයි.

(3) තමන් කැමති අය සමග පමණක් කණ්ඩායම් සාදයි.

(4) තමන්ට වරදක් සිදුකළ සිසුවා ප්‍රතික්ෂේප කරයි.

**35.** "එකිනෙකා තම තමාගේ මිදිවැල යට ද අත්තික්කා ගස යට ද යෙහෙන් වාසය කරනු ඇත." මීකා දිවැසිවරයා මෙයින් අදහස් කළේ කුමක් ද?

(1) සමෘද්ධිමත් කාලයක් උදාවන බව
(2) පීඩා කාලයක් ඇතිවන බව
(3) නිවාස අහිමිවන බව
(4) ගස්වැල් යට වාසය කිරීමට සිදුවන බව

**36.** මෝල්ටාවේ දී සිරකරුවන් වූ පාවුල්තුමා ඇතුළු පිරිසට ආගන්තුකයන් විසින් සත්කාර දක්වන ලදී. එම සිදුවීම තුළින් අපට උගත හැකි පාඩම කුමක් ද?

(1) අපට උපකාර කරන අයට සත්කාර කළයුතු බව

(2) සිරකරුවන්ට ආගන්තුක සත්කාර කළයුතු බව

(3) ආගන්තුකයන්ට තරාතිරම නොබලා සත්කාර කළයුතු බව

(4) අන් අයගේ ප්‍රසාදය ලබාගැනීම සඳහා සත්කාර කළයුතු බව

**37.** සුදු කළු ජාතීන් අතර අන්තර් සම්බන්ධතාවක් ගොඩනැගීමට ක්‍රියා කළ පූජකතුමා වන්නේ,

(1) නෙල්සන් මැන්ඩෙලා ය.
(2) මයිකල් රුදිගෝ ය.
(3) දෙවන ජුවාම් පාවුල් පාප් වහන්සේ ය.
(4) මයිකල් ලැප්ස්ලි ය.

**38.** පහත ප්‍රකාශ සලකා බලන්න.

A - සැබෑ වෙනසක් සඳහා නිහඬව බලා සිටීම
B - ප්‍රචණ්ඩත්වය තුළින් යුක්තිය තහවුරු කිරීම
C - යුක්ති සාධාරණ සමාජයක් ඇති කිරීම
D - අසරණයින්ට පිළිසරණක් ලබාදීමට කටයුතු කිරීම

ආමොස්ගේ මෙහෙවර අද සමාජයට අදාළ වන ආකාරය නිවැරදිව සඳහන් ප්‍රකාශ යුගලය අඩංගු පිළිතුර වන්නේ කුමක් ද?

(1) A හා B  (2) A හා C  (3) B හා C  (4) C හා D

**39.** පාවුල්තුමා ඇතන්ස් හි දී කළ දේශනය තුළින් අද කිතුනු මෙහෙවරෙහි යෙදෙන්නන්ට උගත ගත හැකි පාඩම වනුයේ,

(1) දේව වචනය නොපසුබට වීර්යයෙන් පසුබිම නොතකා සුබසුන ප්‍රකාශ කළ යුතු බවයි.

(2) ප්‍රඥාවෙන් දාර්ශනිකයන් වූවන් සඳහා පමණක් සුබසුන දේශනය කළ යුතු බවයි.

(3) නොපසුබට වීර්යයෙන්, උද්යෝගයෙන් සහ ප්‍රඥාවෙන් සුබසුන හඳුන්වා දිය යුතු බවයි.

(4) නොපසුබට වීර්යයෙන් හා බලහත්කාරයෙන් සුබසුන හඳුන්වා දිය යුතු බවයි.

**40.** පාවුල්තුමා සිරකරුවෙකු ලෙස සිටියදී පවා දැක්වූ ප්‍රතිචාර මගින් දෙනු ලබන ආදර්ශය කුමක් ද?

(1) පීඩා කරන්නන්ට විරුද්ධව ක්‍රියා කළ යුතු බව

(2) පීඩා මධ්‍යයේ වුව ද අප ජේසුස් වහන්සේගේ සාක්ෂිකරුවන් විය යුතු බව

(3) සුදුසු වාතාවරණයකදී පමණක් සත්‍යවාදී විය යුතු බව

(4) අන් අයගෙන් උපකාර ලැබෙන තෙක් අපේක්ෂාවෙන් සිටිය යුතු බව

* *

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது /All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

2598

**15 | S | I, II**


අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය, 2023(2024)
கல்விப் பொதுத் தராதரப் பத்திர (சாதாரண தர)ப் பரீட்சை, 2023(2024)
General Certificate of Education (Ord. Level) Examination, 2023(2024)

| | |
|---|---|
| **ක්‍රිස්තියානි ධර්මය** | **I, II** |
| கிறிஸ்தவம் | I, II |
| Christianity | I, II |

## ක්‍රිස්තියානි ධර්මය II

* **පළමුවැනි** ප්‍රශ්නය හා තවත් ප්‍රශ්න **හතරක්** ඇතුළු ව ප්‍රශ්න **පහකට** පමණක් පිළිතුරු සපයන්න.
* පළමුවැනි ප්‍රශ්නයට ලකුණු **20** ක් ද තෝරා ගන්නා අනෙක් ප්‍රශ්නයකට ලකුණු **10** බැගින් ද හිමි වේ.

**1.** (i) (අ) චර්මඡේදන පිළිවෙත ආරම්භ වූයේ කුමන පීතෘවරයා සම්බන්ධ කරගෙන ද?

(ආ) 

"එහි මුල්වලින් අළුත් පැළයක් නැගී එන්නේ ය ..." මෙම ප්‍රකාශය සිදුකළේ කුමන දිවැසිවරයා විසින් ද?

(ii) "ඔබ යළිත් හැරුණු පසු ඔබේ සහෝදරයන් ධෛර්යමත් කරන්න." මෙම ප්‍රකාශය සිදුකළේ කවුරුන් විසින් කා හට ද?

(iii) දේව රාජ්‍යය ප්‍රකාශ කිරීමට ජේසුස් වහන්සේ යොදා ගත් උපක්‍රම **දෙකක්** ඉදිරිපත් කරන්න.

(iv) 'සුදර්ශන දොරටුව' අසල සිටි කොර වූ මිනිසාට පේදුරු සහ ජොහාන් තමන් සතුව **නොමැති** බව පැවසූ වස්තූන් **දෙක** නම් කරන්න.

(v) ශුද්ධ බයිබලයේ සඳහන් 'ශුද්ධාත්මයාණන්' හා 'ගින්න' යන සංකේත **දෙක** මගින් කුමක් අනාවරණය කෙරේ ද?

(vi) "ඔබේ ඉඟ පටිය බැඳගන්න, පහන් දල්වා තබා ගන්න." ලෙස, ජේසුස් වහන්සේ ඉදිරිපත් කළ රූපකයන්ගෙන්, කිතුනුවන්ගෙන් අපේක්ෂා කරන ප්‍රධාන ගුණාංග **දෙකක්** ලියන්න.

(vii) පාවුල් තුමාගේ තුන්වන ධර්මදූත චාරිකාවේ 'එපීසයේ' දී ඔහු මුහුණ දුන් අභියෝග **දෙකක්** සඳහන් කරන්න.

(viii) මුල් කිතුනු සභාවේ සමානාත්මතාව සහ සහජීවනය සඳහා ගත් සුබසාධක මෙහෙවරයන් **දෙකක්** ලියන්න.

(ix) නිවැරදි වචන යොදා පහත සඳහන් බයිබල් පාඨය සම්පූර්ණ කරන්න.

"සාමය ඇතිකරන්නෝ ........................., ඔවුහු දෙවියන් වහන්සේගේ ...................... යයි කියනු ලබන්නෝ ය."

(x) 'පටු දොරටුව' හා 'පුළුල් දොරටුව' යන සංකල්ප මගින් ජේසුස් වහන්සේ ඉදිරිපත් කළ සත්‍යයන් **දෙක** කුමක් ද?

**2.** (i) ජේසුස් වහන්සේට පාළුකරයේ දී පැමිණි පරීක්ෂාවන් **දෙකක්** ලියන්න.

(ii) පරීක්ෂාවන් **තුන** ජය ගැනීමට ජේසුස් වහන්සේ දැක් වූ ප්‍රතිචාර වෙන් වෙන් වශයෙන් ලියා දක්වන්න.

(iii) අප එදිනෙදා මුහුණපාන පරීක්ෂාවන් ජය ගන්නා ආකාරය කරුණු **පහක්** මගින් පැහැදිලි කරන්න.

[හත්වැනි පිටුව බලන්න.

**3.** (i) දේව රාජ්‍යයේ වර්ධනය පිළිබඳ ජේසුස් වහන්සේ වදාළ උපමා **දෙකක්** ලියන්න.

(ii) මහා මංගල භෝජනයට මුලින්ම ආරාධනය ලැබූ ජුදෙව්වන් එය ප්‍රතික්ෂේප කිරීමට යොදාගත් කරුණු **තුන** සඳහන් කරන්න.

(iii) දේව රාජ්‍යයේ වටිනාකම් පෙරදැරි කරගෙන ඒ අනුව ඔබ ක්‍රියා කරන්නේ කෙසේදැයි කරුණු **පහකින්** පහදන්න.

**4.** (i) (අ) මුල්ම කිතුනු වේද සාක්ෂිකයා කවුද?

(ආ) ඔහු මරණයට පත්වූයේ කෙසේද?

(ii) පාවුල්ගේ පළමුවන සහ දෙවන ධර්මදූත චාරිකාවලදී ඔහුට මුහුණ පෑමට සිදු වූ දුක් විඳීම් අවස්ථා **තුනක්** ඉදිරිපත් කරන්න.

(iii) මුල් වේද සාක්ෂිකයා හා පාවුල්ගේ පීඩා හා දුක් විඳීම් පාදක කරගෙන අප අද ධර්මදූත මෙහෙවරේ දී ක්‍රියා කළ යුතු ආකාරය කරුණු **පහකින්** විස්තර කරන්න.

**5.** (i) (අ) කිතුනු ඔබ සැමරූ පාස්කු දිනයේ දී සිහිපත් කළේ ජේසුස් වහන්සේගේ කුමන වැදගත් සිද්ධියක් ද?

(ආ) ජුදෙව් ජනතාව පාස්කු මංගල්‍යයේ දී තිත්ත පලා අනුභව කළේ කුමන සිද්ධියක් සිහිපත් කිරීමට ද?

(ii) කිතුනු පාස්කු මංගල්‍ය සමයේ දී ජේසුස් වහන්සේගේ දුක් විඳීම හා මරණයට පාදක වූ වැදගත් සිද්ධි **තුනක්** ලියන්න.

(iii) ඉහත (ii) හි සඳහන් ඔබේ පිළිතුරු අදාළ කරගෙන, ඇදහිලිවන්ත කිතුනුවන් සේ ජීවත්වීමට, අප ලබන ඉගැන්වීම් **පහක්** ඉදිරිපත් කරන්න.

**6.** (i) සාමාන්‍ය ලෝකයේ අප ප්‍රතික්ෂේප කරන නායකත්ව ලක්ෂණ **දෙකක්** ලියන්න.

(ii) ජේසුස් වහන්සේ තුළ දක්නට ලැබුණු නායකත්ව ගුණාංග **තුනක්** ඉදිරිපත් කරන්න.

(iii) දේව රාජ්‍යයේ පුරවැසියෙක් ලෙස පාසල තුළ නායකත්වයක් දරන ඔබ ක්‍රියා කළ යුතු අන්දම උදාහරණ **පහක්** ඇසුරෙන් විස්තර කරන්න.

**7.** පහත සඳහන් මාතෘකා අතුරෙන් **දෙකක්** තෝරා ගෙන කෙටි සටහන් ලියන්න. ඒ සඳහා දී ඇති උපදෙස් වාක්‍ය භාවිත කරන්න.

(i) කිතුනු එක්සත්කම

- විවිධත්වය තුළ ඒකත්වය
- ජේසුස් වහන්සේගේ උත්තම පූජක යාච්ඤාව
- කුරුසිය මගින් සමගි කිරීම ඇති බව
- එක්සත්කම ගෙන ඒම සඳහා උත්සාහ දරන සංවිධාන
- එකමුතුකම ඇතිකිරීමට මට කුමක් කළ හැකි ද?

(ii) ජීවිත වෙනසක්

- නව ගිවිසුම තුළ සහමුලින්ම ජීවිත වෙනසට මුහුණ දුන් චරිත
- මෙහි ඔබ හඳුන්වා ඇති චරිත සහමුලින්ම වෙනස් වීමට තුඩුදුන් කරුණු
- මොවුන්ගේ පූර්ණ වෙනස් වූ ජීවිතවලින් අප ඉගෙන ගන්නා පාඩම්
- අපගේ වෙනස්වීම සඳහා දායක වන පුද්ගලයන් හා අවස්ථා
- පූර්ණ ලෙස වෙනස් වූ ජීවිතයක ගුණාත්මක වටිනාකම්

(iii) රූප විපර්යාසය/අන්වෙසක් වීමේ සිද්ධිය

- අන්වෙසක් වීමේ සිද්ධිය
- ජේසුස් වහන්සේ සමග වූ දෙදෙනාගේ වැදගත්කම
- ගෝලයන්ගේ ප්‍රතිචාරය
- ගෝලයන්ට ඇසුනා වූ හඬ තුළින් ලද පණිවිඩය
- ජේසුස් වහන්සේ පිළිබඳ නව තේරුම් ගැනීම

(iv) පිවිතුරු දිවියක්

- පිවිතුරු ජීවිතයකට කැඳවීම ලැබීම
- පිවිතුරු දිවියක ලක්ෂණ
- පිවිතුරු දිවියට කැඳවීමට දක්වන ප්‍රතිචාර
- පිවිතුරු ජීවිතයක අවශ්‍යතාව
- පිවිතුරු ලෙස ජීවත්වීම

***

සියලු ම හිමිකම් ඇවිරිණි.


රහස්‍ය ලේඛනයකි.

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව

# අ.පො.ස. (සා.පෙළ) විභාගය - 2023 (2024)

# 15 - ක්‍රිස්තියානි ධර්මය

## ලකුණු දීමේ පටිපාටිය



මෙය උත්තරපත්‍ර පරීක්ෂකවරුන්ගේ ප්‍රයෝජනය සඳහා සකස් කෙරිණි.
ප්‍රධාන පරීක්ෂක රැස්වීමේ දී ඉදිරිපත්වන අදහස් අනුව මෙහි වෙනස්කම් කරනු ලැබේ.

අවසන් සංශෝධන ඇතුළත් කළ යුතුව ඇත.

# අ.පො.ස. (සා.පෙළ) විභාගය - 2023 (2024)
## උත්තරපත්‍ර ලකුණු කිරීමේ පොදු ශිල්පීය ක්‍රම

උත්තරපත්‍ර ලකුණු කිරීමේ හා ලකුණු ලැයිස්තුවල ලකුණු සටහන් කිරීමේ සම්මත ක්‍රමය අනුගමනය කිරීම අනිවාර්යයෙන් ම කළ යුතුවේ. ඒ සඳහා පහත සඳහන් පරිදි කටයුතු කරන්න.

1. සෑම සහකාර පරීක්ෂකවරයකුම උත්තරපත්‍ර ලකුණු කිරීමට රතුපාට බෝල් පොයින්ට් පෑනක් පාවිච්චි කරන්න.
2. ප්‍රධාන පරීක්ෂක විසින් දම්පාට බෝල් පොයින්ට් පෑනක් පාවිච්චි කළ යුතුය.
3. සෑම උත්තරපත්‍රයක ම මුල් පිටුවේ සහකාර පරීක්ෂක සංකේත අංකය සටහන් කරන්න.
   ලකුණු සටහන් කිරීමේ දී **පැහැදිලි ඉලක්කමෙන්** ලියන්න.
4. ඉලක්කම් ලිවීමේ දී යම් වැරදීමක් සිදු වුවහොත් එය පැහැදිලිව තනි ඉරකින් කපා හැර නැවත ලියා අත්සන යොදන්න.
5. එක් එක් ප්‍රශ්නයේ අනු කොටස්වල පිළිතුරු සඳහා හිමි ලකුණු ඒ ඒ කොටස අවසානයේ △ ක් තුළ භාග සංඛ්‍යාවක් ලෙස ලියා දක්වන්න. අවසාන ලකුණු ප්‍රශ්න අංකයත් සමඟ □ ක් තුළ, භාග සංඛ්‍යාවක් ලෙස ඇතුළත් කරන්න. ලකුණු සටහන් කිරීම සඳහා පරීක්ෂකවරයාගේ ප්‍රයෝජනය සඳහා ඇති තීරුව භාවිත කරන්න.
6. ගණිත පරීක්ෂක විසින් ලකුණු නිවැරදි බව සටහන් කිරීමට නිල් හෝ කළු පෑනක් භාවිතා කළ යුතුය.

උදාහරණ : ප්‍රශ්න අංක 03

| | | | |
|---|---|---|---|
| (i) | ......................................... | √ | $\frac{4}{5}$ (△) |
| (ii) | ......................................... | √ | $\frac{3}{5}$ (△) |
| (iii) | ......................................... | √ | $\frac{3}{5}$ (△) |
| 03 | එකතුව | → | $\frac{10}{15}$ (□) |

**බහුවරණ උත්තරපත්‍ර :**

01. කවුළු පත්‍රය සැකසීම

I. ලකුණු දීමේ පටිපාටිය අනුව නිවැරදි වරණ කවුළු පත්‍රයේ සටහන් කරන්න.

II. එසේ ලකුණු කළ කවුළු බ්ලේඩ් තලයකින් කපා ඉවත් කරන්න.

III. කවුළු පත්‍රය උත්තරපත්‍රය මත නිවැරදිව තබා ගත හැකි වන පරිදි විභාග අංක කොටුව හා නිවැරදි පිළිතුරු ගණන දක්වෙන කොටුව ද කපා ඉවත් කරන්න.

IV. හරි පිළිතුරු හා වැරදි පිළිතුරු ලකුණු කළ හැකි වන පරිදි එක් එක් වරණ පේළිය අවසානයේ හිස් තීරයක් ද කපා ඉවත් කරන්න.

V. විභාග අංකය හා විෂය පැහැදිලිව පෙනෙන ආකාරයට එම කොටු ද කපා ඉවත් කරන්න.

VI. සකස් කරගත් කවුළු පත්‍රය ප්‍රධාන පරීක්ෂකවරයා ලවා අත්සන් යොදා අනුමත කර ගන්න.

[illegible] අනතුරුව උත්තරපත්‍ර හොඳින් පරීක්ෂා කර බලන්න. කිසියම් ප්‍රශ්නයකට එක් පිළිතුරකට වඩා ලකුණු කර ඇත්නම් හෝ එකම පිළිතුරක්වත් ලකුණු කර නැත්නම් හෝ වරණ කැපී යන ලෙසට ඉරක් අඳින්න. ඇතැම් විට අයදුම්කරුවන් විසින් මුලින් ලකුණු කර ඇති පිළිතුරක් මකා

**වෙනත් පිළිතුරක් ලකුණු කර තිබිය හැක. එසේ මකන ලද අවස්ථාවකදී පැහැදිලිව මකා නොමැති නම් මකන ලද වරණය මත ද ඉරක් අඳින්න.**

03. කවුළු පත්‍රය උත්තරපත්‍රය මත නිවැරදිව තබන්න. නිවැරදි පිළිතුර ✓ ලකුණකින් ද, වැරදි පිළිතුර x ලකුණකින් ද ලකුණු කරන්න. නිවැරදි පිළිතුරු සංඛ්‍යාව ඒ ඒ වරණ තීරයට පහළින් ලියා දක්වන්න. අනතුරුව එම සංඛ්‍යා එකතු කර මුළු නිවැරදි පිළිතුරු සංඛ්‍යාව අදාළ කොටුව තුළ ලියන්න.

**ව්‍යුහගත රචනා හා රචනා උත්තරපත්‍ර :**

1. අයදුම්කරුවන් විසින් උත්තරපත්‍රයේ හිස්ව තබා ඇති පිටු හරහා රේඛාවක් ඇඳ කපා හරින්න. වැරදි **හෝ නුසුදුසු පිළිතුරු යටින් ඉරි ඇඳ වැරදි දමන්න. ලකුණු දිය හැකි ස්ථානවල හරි ලකුණු යෙදීමෙන් එය පෙන්වන්න.**

2. ලකුණු සටහන් කිරීමේදී ඕවර්ලන්ඩ් කඩදාසියේ දකුණු පස තීරය යොදා ගත යුතු වේ.

3. සෑම ප්‍රශ්නයකට ම දෙන මුළු ලකුණු උත්තරපත්‍රයේ මුල් පිටුවේ ඇති අදාළ කොටුව තුළ ප්‍රශ්න අංකය ඉදිරියෙන් **අංක දෙකකින් ලියා දක්වන්න.** ප්‍රශ්න පත්‍රයේ දී ඇති උපදෙස් අනුව ප්‍රශ්න තෝරා ගැනීම කළ යුතුවේ. සියලු ම උත්තර ලකුණු කර ලකුණු මුල් පිටුවේ සටහන් කරන්න. ප්‍රශ්න පත්‍රයේ දී ඇති උපදෙස්වලට පටහැනිව වැඩි ප්‍රශ්න ගණනකට පිළිතුරු ලියා ඇත්නම් අඩු ලකුණු සහිත පිළිතුරු කපා ඉවත් කරන්න.

4. පරීක්ෂාකාරීව මුළු ලකුණු ගණන එකතු කොට මුල් පිටුවේ නියමිත ස්ථානයේ ලියන්න. උත්තරපත්‍රයේ සෑම උත්තරයකටම දී ඇති ලකුණු ගණන උත්තරපත්‍රයේ පිටු පෙරළමින් නැවත එකතු කරන්න. එම ලකුණ ඔබ විසින් මුල් පිටුවේ එකතුව ලෙස සටහන් කර ඇති මුළු ලකුණට සමාන දැයි නැවත පරීක්ෂා කර බලන්න.

**ලකුණු ලැයිස්තු සකස් කිරීම :**

I. එක් පත්‍රයක් පමණක් ඇති විෂයන් හැර ඉතිරි සියලු ම විෂයන්හි අවසාන ලකුණු ඇගයීම් මණ්ඩලය තුළදී ගණනය කරනු නොලැබේ.

II. එක් එක් පත්‍රයට අදාළ අවසාන ලකුණු වෙන වෙනම ලකුණු ලැයිස්තුවලට ඇතුළත් කළ යුතුය.

III. I පත්‍රයට අදාළ ලකුණු, ලකුණු ලැයිස්තුවේ "Total Marks" තීරුවේ ඇතුළත් කර අකුරෙන් ද **ලියන්න.**

IV. II පත්‍රයේ ලකුණු ලැයිස්තුව සැකසීමේ දී විස්තර ලකුණු ඇතුළත් කිරීමෙන් අනතුරුව II පත්‍රයේ අවසාන ලකුණු, ලකුණු ලැයිස්තුවේ "Total Marks" තීරුවේ ඇතුළත් කරන්න.

V. 43 චිත්‍ර විෂයයේ I, II හා III පත්‍රවලට අදාළ ලකුණු වෙන වෙනම ලකුණු ලැයිස්තුවල ඇතුළත් **කර අකුරෙන් ද ලිවිය යුතු වේ.**

VI. 21 - සිංහල භාෂාව හා සාහිත්‍යය, 22 - දෙමළ භාෂාව හා සාහිත්‍යය යන විෂයන්හි I පත්‍රයේ ලකුණු ඇතුළත් කර අකුරෙන් ලිවිය යුතු ය. II හා III පත්‍රවල විස්තර ලකුණු ඇතුළත් කර ඒ ඒ පත්‍රයේ මුළු ලකුණු, ලකුණු ලැයිස්තුවට ඇතුළත් කළ යුතු ය.

සැ.යු :- **(I) සෑම විටම එක් එක් පත්‍රයට අදාළ මුළු ලකුණු පූර්ණ සංඛ්‍යාවක් ලෙස ලකුණු ලැයිස්තුවට ඇතුළත් කළ යුතු ය. කිසිදු අවස්ථාවක පත්‍රයේ අවසාන ලකුණු දශම සංඛ්‍යාවකින් හෝ භාග සංඛ්‍යාවකින් නොතැබිය යුතු ය.**

**(II) ලකුණු ලැයිස්තුවල සෑම පිටුවකම ලකුණු ඇතුළත් කළ සහකාර පරීක්ෂක, ලකුණු පරීක්ෂා කළ සහකාර පරීක්ෂක, ඇගයීම් ලකුණු තහවුරු කිරීමේ පරීක්ෂක හා ප්‍රධාන පරීක්ෂක තම සංකේත අංකය යොදා අත්සන් කිරීමෙන් නිරවද්‍යතාව තහවුරු කිරීම අනිවාර්ය වේ.**

## ලකුණු දීමේ පටිපාටිය

පළමු ප්‍රශ්න පත්‍රයට ලකුණු 1 x 40 - 40

දෙවන ප්‍රශ්න පත්‍රය සඳහා - 60

මුළු ලකුණු - 100

## II වන පත්‍රය

1 වන අනිවාර්ය ප්‍රශ්නයට ලකුණු 02 බැගින් 10 - 20

2 වන - 7 වන ප්‍රශ්න සඳහා තෝරා ගත් ප්‍රශ්න 4 ලකුණු 10 බැගින් - 40

60

## කොටස් ලකුණු බෙදීම

2 - 6 දක්වා සෑම ප්‍රශ්නයක් සඳහා

අ. කොටසට - ලකුණු 2

ආ. කොටසට - ලකුණු 3

ඉ. කොටසට - ලකුණු 5

10

## I - ප්‍රශ්න පත්‍රයේ අභිමතාර්ථ

බහුවරණ ප්‍රශ්ණ පත්‍රයේ ඇති සියලුම ප්‍රශ්න දනුම උරගා බැලීමක් සහ දිනපතා ජීවිතයට අදාළ කර ගැනීමේ හැකියාව තහවුරු කිරීමත් අපේක්ෂිත ය. ඒ සඳහා 10 සහ 11 ශ්‍රේණි පොත් සහ බයිබලයේ ඊට අදාළ කොටස් නිසියාකාරව හදාරා තිබීම වැදගත් ය. වරණ අතුරින් ඉතාම සුදුසු එක තේරීමට ශිෂ්‍ය ශිෂ්‍යාවනට හැකි වීම බලාපොරොත්තු වේ.

මෙම පත්‍රයේ එක් ප්‍රශ්නයකට එක ලකුණ බැගින් හිමි වේ. I වන පත්‍රයට මුළු ලකුණු ගණන 40 කි.

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்

**අ.පො.ස.(සා.පෙළ) විභාගය - 2023 (2024)**
க.பொ.த (சா.தர)ப் பரீட்சை – 2023 (2024)

විෂයය අංකය / பாட இலக்கம்: **15**
විෂයය / பாடம்: **ක්‍රිස්තියානි ධර්මය**

## I පත්‍රය - පිළිතුරු

| ප්‍රශ්න අංකය<br>வினா இல. | පිළිතුරෙහි අංකය<br>விடை இல. | ප්‍රශ්න අංකය<br>வினா இல. | පිළිතුරෙහි අංකය<br>விடை இல. | ප්‍රශ්න අංකය<br>வினா இல. | පිළිතුරෙහි අංකය<br>விடை இல. | ප්‍රශ්න අංකය<br>வினா இல. | පිළිතුරෙහි අංකය<br>விடை இல. |
|---|---|---|---|---|---|---|---|
| 01. | 4 | 11. | 2 | 21. | 2 | 31. | 1 |
| 02. | 2 | 12. | 4 | 22. | 4 | 32. | 3 |
| 03. | 2 | 13. | 3 | 23. | 4 | 33. | 3 |
| 04. | 1 | 14. | 1 | 24. | 1 | 34. | 2 |
| 05. | 4 | 15. | 2 | 25. | 3 | 35. | 1 |
| 06. | 1 | 16. | 3 | 26. | 3 | 36. | 3 |
| 07. | 2 | 17. | 4 | 27. | 4 | 37. | 4 |
| 08. | 1 | 18. | 1 | 28. | 3 | 38. | 4 |
| 09. | 2 | 19. | 3 | 29. | 2 | 39. | 3 |
| 10. | 2 | 20. | 3 | 30. | 2 | 40. | 2 |

විශේෂ උපදෙස් එක් පිළිතුරකට ලකුණු **01** බැගින්
விசேட அறிவுறுத்தல் ஒரு சரியான விடைக்கு **01** புள்ளி வீதம்

මුළු ලකුණු / மொத்தப் புள்ளிகள் **01 × 40 = 40**

---

පහත නිදසුනෙහි දැක්වෙන පරිදි බහුවරණ උත්තර පත්‍රයේ අවසාන තීරුවේ ලකුණු ඇතුළත් කරන්න.
கீழ் குறிப்பிடப்பட்டிருக்கும் உதாரணத்திற்கு அமைய பல்தேர்வு வினாக்களுக்குரிய புள்ளிகளை பல்தேர்வு வினாப்பத்திரத்தின் இறுதியில் பதிக.

නිවැරදි පිළිතුරු සංඛ්‍යාව / சரியான விடைகளின் தொகை: $\frac{25}{40}$

I පත්‍රයේ මුළු ලකුණු / பத்திரம் I இன் மொத்தப்புள்: $\frac{25}{40}$

## II වන ප්‍රශ්න පත්‍රයේ අභිමතාර්ථ

නිපුණතා සහ දැනුම වර්ධනය කිරීම මෙම ප්‍රශ්න පත්‍රය තුළින් අපේක්ෂා කෙරේ. ප්‍රශ්න සියල්ල පදනම් වී ඇත්තේ 10,11 වසර පෙළ පොත් දෙක හා ශුද්ධ බයිබලය ඇසුරෙන්ය. I වන ප්‍රශ්නය අනිවාර්ය වේ. පිළිතුරු නිශ්චිත විය යුතුය. සෙසු ව්‍යුහගත ප්‍රශ්නවල 3 වන කොටස සිසුන්ගේ ආකල්ප හා නිපුණතා වර්ධනයට යොමු කෙරේ. එහෙයින් එම කොටසට වැඩි ලකුණු පිරිනැමේ. පිළිතුරු පතෙහි සඳහන් නොවූවත් එම කොටසට/ ප්‍රශ්නයට අදාළ සිසු අත්දැකීම් ඉදිරිපත් කර ඇත්නම් ලකුණු ප්‍රදානය කළ හැකිය.

### ලකුණු දීමේ උපදෙස්

I වන අනිවාර්ය ප්‍රශ්නයට කොටස් 10ක් ඇතුළත්ය. එක් කොටසකට ලකුණු 02 බැගින් පිරිනැමේ.

10 x 2 = 20

සෙසු තෝරාගත් ප්‍රශ්නවලට ලකුණු පිරිනැමිය යුත්තේ -

| | ලකුණු |
|---|---|
| (i) වන කොටසට | 02 |
| (ii) වන කොටසට | 03 |
| (iii) වන කොටසට | 05 |
| මුළු ලකුණු සංඛ්‍යාව | 10 |

තෝරාගත් ප්‍රශ්න 4 ට 10 x 4 = 40

II වන ප්‍රශ්න පත්‍රයේ මුළු ලකුණු සංඛ්‍යාව 60 කි.

# අ.පො.ස. (සා.පෙළ) විභාගය - 2023 (2024)


# 15 - ක්‍රිස්තියානි ධර්මය

## II පත්‍රය

* පළමුවැනි ප්‍රශ්නය හා තවත් ප්‍රශ්න 4 කට පිළිතුරු සපයන්න.
පළමුවැනි ප්‍රශ්නය අනිවාර්ය වේ. ලකුණු 20 ක් හිමි වේ.

### ප්‍රශ්න අංක 01

(i) (අ) චර්මඡේදන පිළිවෙත ආරම්භ වූයේ කුමන පිතෘවරයා සම්බන්ධ කරගෙන ද?

(ආ)  "එහි මුල්වලින් අළුත් පැළයක් නැගී එන්නේ ය ..." මෙම ප්‍රකාශය සිදුකළේ කුමන දිව්‍යසිවරයා විසින් ද?

(අ) ආබ්‍රහම්
(ආ) යෙසයා දිවැසිවරයා

(ii) "ඔබ යළිත් හැරුණු පසු ඔබේ සහෝදරයන් ධෛර්යමත් කරන්න." මෙම ප්‍රකාශය සිදුකළේ කවුරුන් විසින් කා හට ද?

ජේසුස් වහන්සේ විසින් සීමොන් පේදුරු ට

(iii) දේව රාජ්‍යය ප්‍රකාශ කිරීමට ජේසුස් වහන්සේ යොදා ගත් උපක්‍රම **දෙකක්** ඉදිරිපත් කරන්න.

උපමා/කතාන්දර/ ජීවිතාදර්ශ/ දේශනා/ සංකේතාත්මක ක්‍රියා/ සුවකිරීම් /එදිනෙදා ජීවන අත්දැකීම්

(iv) 'සුදර්ශන දොරටුව' අසල සිටි කොර වූ මිනිසාට පේදුරු සහ ජොහාන් තමන් සතුව **නොමැති** බව පැවසූ වස්තූන් **දෙක** නම් කරන්න.

රන් හා රිදී

(v) ශුද්ධ බයිබලයේ සඳහන් 'ශුද්ධාත්මයාණන්' හා 'ගින්න' යන සංකේත **දෙක** මගින් කුමක් අනාවරණය කෙරේ ද?

ශුද්ධාත්මයාණන් - නව ජීවන පැවැත්ම/ ආලෝකය, ධෛර්යය /ශක්තිය / ශුද්ධාත්ම ක්‍රියාකාරීත්වය/අපවිත්‍ර දේ ඉවත් කරමින් පුළුස්සමින් ජීවිත අළුත් කිරීමක් ( 10 පිටු 24)

ගින්න - දේව අභිමුඛත්වය/ බලය / පාපය දවාලා පිරිසිදුවීම / පවිත්‍ර වීම ( 10 පිටු 76)
පැරණි ගිවිසුම දෙවියන් වහන්සේගේ වැඩ සිටීම ( 10 පිටු 24)

ශුද්ධාත්ම බලය (11 පිටු 37)

**(vi) "ඔබේ ඉඟ පටිය බැඳගන්න, පහන් දල්වා තබා ගන්න." ලෙස, ජේසුස් වහන්සේ ඉදිරිපත් කළ රූපකයන්ගෙන්, කිතුනුවන්ගෙන් අපේක්ෂා කරන ප්‍රධාන ගුණාංග දෙකක් ලියන්න.**

අවදිව සිටීම/ අපේක්ෂාවෙන් සිටීම/සූදානමින් සිටීම/ නොඉවසිල්ලෙන් සිටීම( 10 පිටු 118)

**(vii) පාවුල් තුමාගේ තුන්වන ධර්මදූත චාරිකාවේ 'එපීසයේ' දී ඔහු මුහුණ දුන් අභියෝග දෙකක් සඳහන් කරන්න.**

- ස්නාවක ජොහාන්ගේ ගෝලයන්ට ජේසුස් වහන්සේ ගැන නොදැන සිටීම/ජොහාන්ගේ බෞතීස්මය
- පමණක් දැන සිටීම/යකැදුරන්ගේ විසින් ජේසුස් වහන්සේ නාමය නිකරුණේ භාවිතා කිරීම/රූප වන්දනාව හා මිත්‍යා විශ්වාසයන් මත සිටීම/ දෙමෙත්‍රියස් ගේ විරෝධය/කෝලාහලය නිසා ඇතී වූ පීඩනය (11 පිටු 64/66)

**(viii) මුල් කිතුනු සභාවේ සමානාත්මතාව සහ සහජීවනය සඳහා ගත් සුබසාධක මෙහෙවරයන් දෙකක් ලියන්න.**

- ක්‍රිස්තු කේන්ද්‍රීයව, බෙදාගැනීම / සියල්ල පොදුවේ තබා ගැනීම/ සමූහයා එක්සත්ව, එක්සිත් ව විසීම,
- තමා සතු දෙයින් කිසිවක් තමාගේයැයි නො පැවසීම/ තම තමන් අතර ත්‍යාගවන්ත සිතින් ආහාර වැනි දේ බෙදාගැනීම/ තමන් සතු දේපළ විකුණා ප්‍රේරිතයන්ට දීම හා එකිනෙකාගේ උවමනාව ප්‍රකාරයට අවශ්‍යතා පියවීම / සභානාධාර කටයුතු සඳහා උපස්ථායකයින් පත් කර වැන්දඹුවන් හා අවශ්‍යතා අනුව මෙහෙවර දියත් කිරීම (11 පිටු 40)

**(ix) නිවැරදි වචන යොදා පහත සඳහන් බයිබල් පාඨය සම්පූර්ණ කරන්න.**

**"සාමය ඇතිකරන්නෝ ........................, ඔවුහු දෙවියන් වහන්සේගේ ...................... යයි කියනු ලබන්නෝ ය."**

භාග්‍යවන්තයෝය/ පුත්‍රයෝ (11 පිටු 19)

**(x) 'පටු දොරටුව' හා 'පුළුල් දොරටුව' යන සංකල්ප මගින් ජේසුස් වහන්සේ ඉදිරිපත් කළ සත්‍යයන් දෙක කුමක් ද?**

- පටු දොරටුව - සදාතන ජීවනයේ මාර්ගය
- පුළුල් දොරටුව - ලෞකික සැප සම්පත්, සමාජ රැල්ල වැනි දේ සමඟ පහසු මාර්ගය

( 10 පිටු 121)

*ලකුණු 2 x 10 = 20*

## ප්‍රශ්න අංක 02

**(i) ජේසුස් වහන්සේට පාළුකරයේ දී පැමිණි පරීක්ෂාවන් දෙකක් ලියන්න.**

ගල් රොටි කිරීම / සාතන්ට නමස්කාර කිරීම/ දේව මාළිගාවේ කොත මුදුනින් පහළට පැනීම

*(ලකුණු 02)*

**(ii) පරීක්ෂාවන් තුන ජය ගැනීමට ජේසුස් වහන්සේ දැක් වූ ප්‍රතිචාර වෙන් වෙන් වශයෙන් ලියා දක්වන්න.**

- **ගල් රොටි කිරීම** - "මිනිසා කෑමෙන් පමණක් ජීවත් නොවේ."
- **සාතන්ට නමස්කාර කිරීම** -"නුඹේ දෙවි වන ස්වාමීන් වහන්සේට පමණක් නමස්කාර කරන්න. උන් වහන්සේට පමණක් සේවය කරන්න."
- **දේව මාළිගාවේ කොත මුදුනින් පහළට පැනීම** - නුඹේ දෙවි වන ස්වාමීන් වහන්සේ පරීක්‍ෂා නො කරන්න." ( 10 පිටු 80/81)

*(ලකුණු 03)*

**(iii) අප එදිනෙදා මුහුණපාන පරීක්ෂාවන් ජය ගන්නා ආකාරය කරුණු පහක් මගින් පැහැදිලි කරන්න.**

- සෑම ගැටළුවකදීම දේව වචනය කියවීමෙන් පිළිතුරු සෙවීම.
- දිනපතා යාච්ඤාවෙන් සවිමත් වී දෙවිඳුන් තුළ රැඳී සිටීම.
- මුදල්, බලය, කීර්තිය පසු පස හඹා නොගොස් දේව ගරුබිය ඇති ජීවිතයක් ගත කිරීම.
- වැඩිහිටියන්, පූජකයන් හමුවී සාකච්ඡා කිරීම මගින් ජය ගැනීම .
- දෙවියන් වහන්සේට පමණක් මුල් තැන දීම.
- යහපත් මිතුරන් ඇසුරු කිරීමෙන්
- දේව රාජ්‍යයේ වටිනාකම් අනුව ජීවත් වීමෙන්
- පරීක්‍ෂා ඉදිරියේ දේව කැමැත්තට යටත් වීම *(ලකුණු 05)*

## ප්‍රශ්න අංක 03

**(i) දේව රාජ්‍යයේ වර්ධනය පිළිබඳ ජේසුස් වහන්සේ වදාළ උපමා දෙකක් ලියන්න.**

වපුරන්නාගේ උපමාව/ අබ ඇටය පිළිබඳ උපමාව හා මුහුන් පිළිබඳ උපමාව *(ලකුණු 02)*

**(ii) මහා මංගල භෝජනයට මුලින්ම ආරාධනය ලැබූ ජුදෙව්වන් එය ප්‍රතික්ෂේප කිරීමට යොදාගත් කරුණු තුන සඳහන් කරන්න.**

ගොන් පස්බානක් මිළයට ගැනීම/ ස්ත්‍රීයක් සරණපාවා ගැනීම හා කෙතක් මිළයට ගැනීම

*(ලකුණු 03)*

**(iii) දේව රාජ්‍යයේ වටිනාකම් පෙරදැරි කරගෙන ඒ අනුව ඔබ ක්‍රියා කරන්නේ කෙසේදැයි කරුණු පහකින් පහදන්න.**

සේවක නායකත්වය/ අන් අය වෙනුවෙන් වැය වීම/ ස්ථානෝචිත ප්‍රඥාවෙන් කටයුතු කිරීම /තලෙන්ත උපරිම ලෙස කැප කිරීම/ පරිත්‍යාගශීලිවීම/ ස්තුතිවන්තභාවය/ ආගන්තුක සත්කාරය/ නිහතමානී බව වැනි අදහස් විස්තර කර ඇත්නම් ලකුණු පිරිනමන්න *(ලකුණු 05)*

## ප්‍රශ්න අංක 04

**(i) (අ) මුල්ම කිතුනු වේද සාක්ෂිකයා කවුද?** ස්තෙපන්

**(ආ) ඔහු මරණයට පත්වූයේ කෙසේද?** ගල් ගසා මැරීම *(ලකුණු 02)*

**(ii) පාවුල්ගේ පළමුවන සහ දෙවන ධර්මදූත චාරිකාවලදී ඔහුට මුහුණ පෑමට සිදු වූ දුක් විඳීම් අවස්ථා තුනක් ඉදිරිපත් කරන්න.**

- ලූස්ත්‍රාවේ දි ගල් ගසා නෙරපීම
- ආගමික හා සංස්කෘතික අභියෝග හමුවේ ස්ත්‍රීන් මූලික සභාව පිහිටීම - පිලිප්පිය
- සිරගතකිරීම, කසපහර දීම, දඬු කඳේ හි ගැසීම
- ජොහාන් මාර්ක් හැරීම යාම නිසා සිත් රිදීම - පර්ගාව
- ජුදෙව්වන්ගේ මරණ තර්ජන හා ගලීයෝ වෙතට දඩුවම් කිරීමට ගෙන යාම (11 පිටු 53/56)

*(ලකුණු 03)*

**(iii) මුල් වේද සාක්ෂිකයා හා පාවුල්ගේ පීඩා හා දුක් විඳීම් පාදක කරගෙන අප අද ධර්මදූත මෙහෙවරේ දී ක්‍රියා කළ යුතු ආකාරය කරුණු පහකින් විස්තර කරන්න.**

- දුක් විඳීමේ දි දෙවිඳුන් ගෙන් දිරිය හා සවිය ලැබීම.
- නිර්භීතව දුක් විඳීමට මුහුණ දීම
- දුක් පීඩා මධ්‍යයේ වුවද දේව වචනය ප්‍රචාරය කිරීම
- අභියෝග මැද ඉවසීමෙන් කටයුතු කිරීම
- යාච්ඤාවෙන් සවිමත් වී දෙවිඳුන් තුළ රැඳි සිටීම.
- දුක් පීඩා මධ්‍යයේ දෙවිඳුන් ට ප්‍රශංසා කිරීම

*(ලකුණු 05)*

*( එක් චරිතයක් ආදර්ශයට ගෙන කරුණු 5ක් සඳහන් කර පිළිතුරු සපයා ඇත්නම් ලකුණු පිරිනමන්න.)*

## ප්‍රශ්න අංක 05

(i) **(අ) කිතුනු ඔබ සැමරූ පාස්කු දිනයේ දී සිහිපත් කළේ ජේසුස් වහන්සේගේ කුමන වැදගත් සිද්ධියක් ද?**

මරණය පරාජය කර උත්ථාන වී

**(ආ) ජුදෙව් ජනතාව පාස්කු මංගල්‍යයේ දී තිත්ත පලා අනුභව කළේ කුමන සිද්ධියක් සිහිපත් කිරීමට ද?**

මිසරයේ වහල් බවින් මිදී ඒම සිහිපත් කිරීම/වහල් භාවයේ කටුකත්වය සිහිපත් කිරීම

(ලකුණු 02)

(ii) **කිතුනු පාස්කු මංගල්‍ය සමයේ දී ජේසුස් වහන්සේගේ දුක් විඳීම හා මරණයට පාදක වූ වැදගත් සිද්ධි තුනක් ලියන්න.**

- රාජ තේජසින් ජෙරුසලමට පිවිසීම/දේව මාලිගාව පවිත්‍ර කිරීම/ ජුදස්ගේ කුමන්ත්‍රණය/ අවසන් රාත්‍රි
- භෝජනය/ ගෝලයන්ගේ පාද සේදීම ( 10 පිටු 52 - 55)
- ගෙත්සමන උයන හා ජුදස් සිඹීම ( 10 පිටු 57)
- විනිශ්චයන් සඳහා ගෙන ඒම ( පිලාත් / හොරොද් හා ජුදෙව් ශ්‍රේෂ්ඨාධිකරණය ( 10 පිටු 57)
- පේදුරු/ කිරේනියේ සීමොන්/ අරිමාතියේ ජෝසප්/ මරියතුමිය ඇතුළු ජෙරුසලමේ ස්ත්‍රීන් /සොරුන් දෙදෙනා හා මුරසෙබළුන් ( 10 පිටු 65 - 70)
- හිමිදිරි පාන්දර සොහොන වෙත ගිය ස්ත්‍රීන් උත්ථානය සාක්ෂි දැරීම ( 10 පිටු 72)

*(ලකුණු 03)*

(iii) **ඉහත (ii) හි සඳහන් ඔබේ පිළිතුරු අදාළ කරගෙන, ඇදහිලිවන්ත කිතුනුවන් සේ ජීවත්වීමට, අප ලබන ඉගැන්වීම් පහක් ඉදිරිපත් කරන්න.**

- සතුරාට ප්‍රේම කිරීම.
- සැම විටම අප කැමැත්ත පසෙකලා දේව කැමැත්තට හිස නැමීම
- පරීක්ෂාවට නොවැටෙන පිණිස නිරන්තරයෙන් යාච්ඤා කිරීම - ගෝලයන් හා උන්වහන්සේ ගෙත්සමන
- නොසිතූ අවස්ථාවන් වලදී පවා දේව සේවයට දායක වීම - කිරේනියේ සීමොන්
- ජේසුස් වහන්සේගේ දුක් විඳීමට කරණකොට ගෙන පාපයට මැරී උත්ථානය මගින් අපගේ ජීවිත අළුත් කර ගැනීම
- සැමවිටම නිදොස් බව හා සත්‍යය ට සාක්ෂි දැරීම
- ජේසුස් වහන්සේ ගේ මාංශය හා රුධිරය කරණකොට ගෙන උන්වහන්සේගේ දුක් විඳීමට පංගුකාරයන් වීම
- සැමවිටම නිහතමානීව සේවයේ නිරතවීම
- යුක්තිය ස්ථාපිත කර අයුක්තිය හා වැරදි ක්‍රියාවන් හෙළා දැක සහෝදරත්වයෙන් සාමයෙන් සිටීම

*(ලකුණු 05)*

*( ඉහත (ii) පිළිතුරු ට අදාළව පිළිතුර සපයා ඇත්නම් ලකුණු පිරිනමන්න.)*

## ප්‍රශ්න අංක 06

(i) **සාමාන්‍ය ලෝකයේ අප ප්‍රතික්ෂේප කරන නායකත්ව ලක්ෂණ දෙකක් ලියන්න.**

ආධිපත්‍ය දරයි/නායකයා අණසක පතුරයි/නායකයා සේවය ලබයි/යටත් අය නායකයා ට සේවය කරයි. ( 10 පිටු 104)

*(ලකුණු 02)*

(ii) **ජේසුස් වහන්සේ තුළ දක්නට ලැබුණු නායකත්ව ගුණාංග තුනක් ඉදිරිපත් කරන්න.**

ප්‍රේමය/ කමාව/ නිහතමානිකම/ මගපෙන්වීම/ ප්‍රතික්ෂේව වුවත් පිළිගැනීම/ පෝෂණය / උන්වහන්සේ වෙත එනතුරු නොසිට අවශ්‍යතා ඇති අය වෙත යෑම/ සැම දෙනාගේ මිදීම පිණිස දිවි පිදීම/ අනුන් වෙනුවෙන් වැයවීම

*(ලකුණු 03)*

(iii) **දේව රාජ්‍යයේ පුරවැසියෙක් ලෙස පාසල තුළ නායකත්වයක් දරන ඔබ ක්‍රියා කළ යුතු අන්දම උදාහරණ පහක් ඇසුරෙන් විස්තර කරන්න.**

- තමා යටතේ සිටින අයගේ අවශ්‍යතාවන් ගැන සැලකිළිමත්වීම/
- හැකියාවන් අගය කර දිරිගැන්වීම
- සැමවිටම අවංකව යහපත් ක්‍රියාවන් සඳහා මගපෙන්වීම
- දුර්වල අයව නගාසිටුවීම
- භේදයකින් තොරව සහජීවනයෙන් කටයුතු කිරීම
- ආදර්ශවත් ලෙස වචනයෙන් ක්‍රියාවෙන් නායකත්වය දැරීම
- වැරදි වටහා දී නිවැරදි මගට ගැනීම
- ප්‍රේමයෙන් කටයුතු කිරීම වැනි අදහස්

*(ලකුණු 05)*

## ප්‍රශ්න අංක 07

**පහත සඳහන් මාතෘකා අතුරෙන් දෙකක් තෝරා ගෙන කෙටි සටහන් ලියන්න. ඒ සඳහා දී ඇති උපදෙස් වාක්‍ය භාවිත කරන්න.**

(i) **කිතුනු එක්සත්කම**

- **විවිධත්වය තුළ ඒකත්වය**
- **ජේසුස් වහන්සේගේ උත්තම පූජක යාච්ඤාව**
- **කුරුසිය මගින් සමගි කිරීම ඇති බව**
- **එක්සත්කම ගෙන ඒම සඳහා උත්සාහ දරන සංවිධාන**
- **එකමුතුකම ඇතිකිරීමට මට කුමක් කළ හැකි ද?**

- අන්‍යෝන්‍ය සහජීවනය සහ යහපැවැත්ම, එකමුතුකම
- ජේසුස් වහන්සේ එම යාච්ඤා තුළින් දෙවියන් වහන්සේ හා ජේසුස් වහන්සේ අතර සම්බන්ධතාවය, ඒකකත්වයෙන් තුළ දිවි ගෙවීම (29 පිටුව 11)
- සමාව දීම මගින් ඒකකත්වයට ගෙන ඒම
- රාජ්‍ය සේවයේ - YMCA, CWF , NCCSL හා YWCA
- ජාතී,ආගම් භේදයකින් තොරව සහජීවනයෙන් කටයුතු කිරීම

**(ii) ජීවිත වෙනසක්**

- **නව ගිවිසුම තුළ සහමුලින්ම ජීවිත වෙනසට මුහුණ දුන් චරිත**
- **මෙහි ඔබ හඳුන්වා ඇති චරිත සහමුලින්ම වෙනස් වීමට තුඩුදුන් කරුණු**
- **මොවුන්ගේ පූර්ණ වෙනස් වූ ජීවිතවලින් අප ඉගෙන ගන්නා පාඩම්**
- **අපගේ වෙනස්වීම සඳහා දායක වන පුද්ගලයන් හා අවස්ථා**
- **පූර්ණ ලෙස වෙනස් වූ ජීවිතයක ගුණාත්මක වටිනාකම්**

- නිකදෙමුස්, සමාරිය ස්ත්‍රිය, පාවුල්, පේදුරු, සාකෙවුස්, මතෙව්
  - **නිකදෙමුස්** - දෙවියන් වහන්සේ වෙතින් වැඩම කළ බව විශ්වාසය හා ගැඹුරු ආත්මික සත්‍යතාවයට ඇතුල්ව පිටු 72
  - **සමාරිය ස්ත්‍රිය** - ජේසුස් වහන්සේ සමග සංවාදයෙන් මෙසියස් බව හඳුනාගෙන ජීවන ජලයෙන් ආත්මික පිපාසයෙන් මිදී ආකල්පයම වෙනසක් පිටු 73
  - **පාවුල්** - දමස්කයට යන අතරමග පිටු 48
  - **පේදුරු** - තමන්ගේ පාපී ස්වභාවය හඳුනා ගැනීම/ ජේසුස් වහන්සේගේ ශුද්ධවන්තකම හා දේවත්වයේ බලය අත්දුටු ඔහු කීකරු වෙමින් පිටු 31
  - **සාකෙවුස්** - ජේසුස් වහන්සේගේ පිළිගැනීම තුළින් හා මුහුණට මුහුණ දැකීම පිටු 37

- පසුතැවීම, පාපය හඳුගැනීම දෙවියන් වහන්සේ කෙරෙහි විශ්වාසය වැනි අදහස්
- පූජකයන්, වැඩිහිටියන්, ගුරුවරුන් හා යහපත් මිතුරන්
- දයාව ,ඉවසීම, සමාව, මත ජීවිත වෙනසක් ඇති

**(iii) රූප විපර්යාසය/අන්වෙසක් වීමේ සිද්ධිය**

- **අන්වෙසක් වීමේ සිද්ධිය**
- **ජේසුස් වහන්සේ සමග වූ දෙදෙනාගේ වැදගත්කම**
- **ගෝලයන්ගේ ප්‍රතිචාරය**
- **ගෝලයන්ට ඇසුනා වූ හඬ තුළින් ලද පණිවිඩය**
- **ජේසුස් වහන්සේ පිළිබඳ නව තේරුම් ගැනීම**

- යාච්ඤා කරනු පිණිස ගෝලයන් සමඟ කන්දකට යෑම
- මුහුණුවර වෙනස් වී බැබළීම/වස්ත්‍ර ධවල කාන්තියෙන් බැබළීම/වළාකුළකින් වැසීම/
- මෝසෙස් - ව්‍යවස්ථාවලිය එළියා - දිව්‍යසිවලිය
- මණ්ඩප තුනක් සෑදීම
- දේව පුත්‍රයා බව තේරුම් ගැනීම
- උන්වහන්සේ මෙසියස්වරයාණන් බවත් / සිදුවන කුරුසි පූජාවත්/ ජීවමාන ජේසුස් වහන්සේ පිළිබඳ නිවැරදි දැක්මක් පිටු 83

**(iv) පිවිතුරු දිවියක්**

**– පිවිතුරු ජීවිතයකට කැඳවීම ලැබීම**

**– පිවිතුරු දිවියක ලක්ෂණ**

**– පිවිතුරු දිවියට කැඳවීමට දක්වන ප්‍රතිචාර**

**– පිවිතුරු ජීවිතයක අවශ්‍යතාව**

**– පිවිතුරු ලෙස ජීවත්වීම**

- යෙසායා පිටු 101
- සුවිශුද්ධකම තේරුම් ගැනීම/මෙයින් පෙනී යන්නේ දෙවියන් වහන්සේ ට පමණක් අයිති බව
- "මෙන්න මා, මෙහිය මා යැව්ව මැනව"
- යෙසායාගේ කැඳවීම තුළින් පාපී ස්වභාවය පිළිගැනීමෙන් දේව කාර්යය මිනිසුන් අතර ඉෂ්ට කිරීම / දේව කැමැත්තට අනුකූලව පිටු 102
- සැමවිටම යහපත සඳහා ක්‍රියාකිරීම/දෙවියන් වහන්සේට අවශ්‍ය ලෙස ජීවත්වීම පිටු 103

*** * * අවධානයට**

**තමා ගැන ලියා ඇත්නම් එය නිවැරදි පිළිතුර ලෙස පිළිගත යුතුයි.**

*(ලකුණු 5 x 2 = 10)*

* * * * * *